**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - 2022**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේදී ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම වශයෙන් රු.12,669,891 ක් ගිණුම්ගත කර තිබුණු අතර ස්ථාවර තැන්පතු කල් පිරීමට පෙර නිදහස් කර ගැනීම හේතුවෙන් ලද පොලී ආදායම රු.10,059,248 ක් වී තිබුණි. ඒ අනුව වැඩිපුර ගිණුම්ගත කර තිබුණු රු.2,610,643 ක පොලී ආදායම ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. 3 ප්‍රකාරව අතීතානුයෝගීව ගලපා නොතිබීමෙන් ලැබිය යුතු පොලී ගිණුමේ ශේෂය සහ රඳවාගත් ඉපයීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | වැඩිපුර ගිණුම් ගත කර තිබූ පොලි ආදායම ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 3 ප්‍රකාරව අතීතනුයෝගිව ගැලපීම සිදු කිරීමට කටයුතු කරමි. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂයට අදාළ පාරිතෝෂිත ප්‍රතිපාදනය ගණනය කිරිමේදි සේවකයින්ගේ සේවා කාලය සම්බන්ධයෙන් පුර්ණ වර්ෂයක් සම්පුර්ණ නොවු අවස්ථාවන්හිදි පුර්ණ වර්ෂයක් සඳහා පාරිතෝෂික ප්‍රතිපාදනය ගණනය කිරීම හේතුවෙන් | සේවා කාලය වර්ෂයක් නොඉක්මවුවද එම සේවකයා එම වර්ෂයේදී සේවයේ රැඳී සිටියා යන්න උපකල්පනය කළ යුතුය .එබැවින් විචක්ෂණ ගිණුම්කරණ සංකල්පය මත පිහිටා ප්‍රතිපාදන පුරෝකථනය කර ඇත. | සේවකයා සේවයේ යෙදී සිටි කාලය සඳහා පමණක් පාරිතෝෂිත ප්‍රතිපාදනය ගණනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| පාරිතෝෂික ප්‍රතිපාදනය රු7 .,146, 199කින් වැඩියෙන් සහ පාරිතෝෂික අධි වෙන් කිරීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| (ආ) විගණනයේ ගණනය කිරීම අනුව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.57,438,109 ක් වුවද , එය රු.55,320,428 ක් වශයෙන් රු.2,117,681 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ආයෝජන වට්ටම් කිරීමේදී, නියමිත පොළී අනුපාතිකයට වඩා අඩු පොලි අනුපාතිකයක් ලබා දීම හේතුවෙන් 2021 වර්ෂයට අදාලව අඩුවන පොළී අදායම පෙර වර්ෂයේ රඳවා ගත් ඉපයීම් වලට ගැලපීම සිදු කල යුතුය. එසේ වුවද එය 2022 වර්ෂයේ පොලි අදායමට ගැලපීම හේතුවෙන් මෙම වෙනස සිදු වී ඇති අතර එය නිවැරදි කිරීමට කටයුතු කරමි | වර්ෂයට අදාළ පොළී ආදායම ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) 2021 වර්ෂයේ අතිකාල වියදම් සඳහා ප්‍රතිපාදනය නොකල රු.152,601 ක් වූ අතිකාල වියදම් සමාලෝචිත වර්ෂයේ උපචිත අතිකාල වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, රඳවාගත් ඉපයීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ප්‍රතිපාදනය නොකළ රු.152,601/- ක් වූ අතිකාල වියදම 2022 වර්ෂයේදී ගෙවා ඇත. එය උපචිත අතිකාල වියදම් ගිණුමට හර කර ඇත. ඉන් පසුව මෙම ප්‍රමාණය පෙර වර්ෂයේ රඳවාගත් ඉපයීම් වලට ගලපා ඇත. ඒ අනුව උපචිත අතිකාල වියදම් ගිණුම තුලනය වී යනු ඇත. | වර්ෂයට අදාළ නොගෙවූ අතිකාල වියදම් සඳහා ප්‍රතිපාදනය කළ යුතුය. |
| (ඈ) විගණනයට ඉදිරිපත් වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව සහ විගණනයේ ගණනය කිරීම අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය අතර රු.7,709,862 ක වෙනසක්ද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය අතර රු.1,932,802 ක වෙනසක්ද, මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය අතර රු. 4,223,417 ක වෙනසක්ද නිරික්ෂණය විය. | ඔබ විසින් පෙන්වා දී ඇති නිර්දේශයන්ට අනුව ගැලපෙන සේ ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකසා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ආයෝජන පාරිතෝෂික අරමුදල් ආයෝජන | 371,291,985<br>79,344,883 | ස්ථාවර තැන්පතු ආයෝජන හා පාරිතෝෂික අරමුදල් ආයෝජන වශයෙන් වර්ගීකරණයට අදාළ බැංකු තහවුරුව | අධිකාරිය වෙත ලැබෙන මුදල් බැංකු ගිණුමකට එක්රැස් කරනු ලබයි. එසේ එක්රැස් වන මුදල්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ වඩාත් වාසිදායක පොලී අනුපාතිකයක් යටතේ රාජ්‍ය බැංකු වෙත ස්ථාවර තැන්පතු ලෙස තැන්පත් කරනු ලැබීය. එම කොටස මූල්‍ය ප්‍රකාශන වල ආයෝජන ලෙස සඳහන් කරනු ලැබ ඇත.<br>සේවක පාරිතෝෂිත මුදල් සඳහා කරනු ලබන වෙන් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ වඩාත් වාසිදායක පොලී අනුපාතිකයක් යටතේ රාජ්‍ය බැංකු වෙත ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කරනු ලැබීය. එම ආයෝජන පාරිතෝෂිත අරමුදල් ආයෝජන ලෙස මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කර ඇත. | වර්ගීකරණය කිරීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ තහනම් කිරීම්වලට යටත් වී ඇති නිලධාරීන්ගෙන් අධිකාරියට අයවිය යුතු රු. 320,942 ක ආපදා ණය ශේෂයන් වර්ෂ 5කට අධික කාලයක සිට අය නොවී පවතින අතර, එම ශේෂ අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි . | එම අයගේ ආපදා ණය ගිවිසුම්වලට අත්සන් කර ඇති ඇපකරුවන්ගෙන් එම මුදල අයකර ගැනීමට හෝ අවශ්‍ය නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරන බවට වැඩිදුරටත් සඳහන් කරමි. | ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.84,120,000 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 7,101,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 77,019,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මුළු ආදායම රු. 92,964 000 කින් වැඩිවීම සහ සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය වියදම සහ ගිවිසුම්ගත සේවා වියදම රු 15,013 000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ජුනි 10 දින දක්වා පැවති ස්ථාවර තැන්පතු ශේෂයන් ඉහළ පොලී අනුපාතයක් යටතේ නැවත ආයෝජනය කර තිබුණු අතර රු.14,259,010 ක් වටිනා ස්ථාවර තැන්පතුවක් එසේ නැවත ආයෝජනය නොකිරීම හේතුවෙන් අධිකාරියට රු.1,651,867 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. | මිල ගණන් කැඳවා සියළු කටයුතු අවසන් කොට තිබූ ඒකාබද්ධ දත්ත පද්ධතිය සඳහා අවශ්‍ය මුදල් මෙමගින් ආවරණය කර ගැනීමටද අනෙකුත් වියදම් සඳහා අවශ්‍ය මුදල් කොටසක්ද මෙමගින් දැරීමට අදහස් කර තිබුණි. එම හේතු නිසා මෙම ස්ථාවර තැන්පතුව එම ආකාරයෙන්ම පවත්වා ගෙන යන ලදී. කෙසේ නමුත් ඉහත ඒකාබද්ධ දත්ත පද්ධතියේ ටෙන්ඩර්පත් අවලංගු වීමත් සමඟම සහ වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයෙන් අනෙකුත් වියදම් සඳහා මුදල් නිදහස් කිරීමත් යන කරුණු මත එම ස්ථාවර තැන්පතුව වට්ටම් නොකරන ලදී. එම අවස්ථාව වන විට වට්ටම් කොට නැවත ආයෝජනය කලේ නම් වාර්ෂික පොළී අනුපතිකයන්ද අඩු වී තිබූ නිසා එය කල් පිරෙන තෙක්ම තිබෙන්නට ඉඩ හරින ලදී. | අධිකාරියට මූල්‍යමය පාඩුවක් නොවන ආකාරයෙන් ඵලදායී ආයෝජන තීරණ ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේදී ආරම්භ කර වර්ෂ කීපයකදී පනතේ වගන්ති 30ක් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබූ අතර මෙම වාර්තාවේ දිනය වන විටත් පනත සංශෝධන කටයුතු | පනත සම්බන්ධව සිදුකර ඇති සංශෝධනයන් නව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2022.07.21 වන දිනැති ලිපිය මඟින් අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී ඇති අතර, ඊට අදාළව අමාත්‍ය මණ්ඩලය පත්‍රිකා අංක අමප 23/0771/627/013 දරන සහ 2023.04.18 දිනැතිව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ සංශෝධනය කිරීම යන මැයෙන් අමාත්‍ය මණ්ඩලය සංදේශය ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇත. | පනත සංශෝධන කටයුතු අවසන් කිරීම සඳහා කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවසන් වී නොතිබුණි. | ඒ අනුව 2023.05.02 පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය 2023.05.09 දිනැතිව අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර අමාත්‍ය මණ්ඩල තීරණයෙහි පිටපතක් අධිකාරිය වෙත යොමු කර ඇති අතර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය. | |
| (ආ) | පනතේ 10 වගන්තිය අනුව භාණ්ඩ ලේබල් කිරීම සම්බන්ධයෙන් එක් කාර්තුවකට දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් බැගින් වර්ෂය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් 100ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ එක් වැඩසටහනක් හෝ පවත්වා නොතිබුණි. | අදාළ වර්ෂය තුළ නිකුත් කර ඇති විධාන අංක 83, 84 හා 85 පිළිබඳව ව්‍යාපාරික ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා අධ්‍යක්ෂ (පාරිභෝගික කටයුතු හා තොරතුරු ) විසින් සියලු පළාත් සහකාර අධ්‍යක්ෂවරු සහ සියලු දිස්ත්‍රික් ප්‍රධානීන් දැනුවත් කරන ලදී. ඒ අනුව ඉහත සඳහන් විධානයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පවත්වන ලදී. එයද ඇතුලත්ව 2022 වර්ෂය තුළ උක්ත කරුණට අදාළව පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය 27 කි . දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ දී භාවිත කරන පරිගණක ගත ඉදිරිපත් කිරීම් (presentation) මගින් මෙම කාර්ය වඩාත් ඵලදායීව, කාර්යක්ෂමව හා අවම පිරිවැයකින් සිදුකල හැකි බව තහවුරු වීමත් සමග 10 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නව විධාන පිළිබඳව වෙන් වෙන් වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ අවශ්‍යතාවක් නොමැති බව නිරීක්ෂණය විය.<br>එසේම නිකුත් කරනු ලබන නව විධානයන් සම්බන්ධයෙන් වන තොරතුරු දැනට භාවිතකරනු ලබන අත් පත්‍රිකාවන් මගින් ද පාරිභෝගික හා ව්‍යාපාරික ප්‍රජාව වෙත සන්නිවේදනය කිරීමට තීරණය කරන ලදි . එමෙන්ම නිකුත් කරනු ලබන සෑම විධානයක් පිළිබඳවම මුද්‍රිත අත් පත්‍රිකා මගින් තොරතුරු සන්නිවේදනය කිරීමේ ඇති ප්‍රායෝගික දුෂ්කරතා හඳුනාගෙන ඊට පිළියමක් ලෙස QR කේතයන් බාගත කර ගැනීම මගින් නව නීති රීති පිළිබඳව ව්‍යාපාරික හා පාරිභෝගික ප්‍රජාව පහසුවෙන් දැනුවත් කිරීමට ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. | දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීමේදී වැඩසටහන් පැවැත්වීමේ අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගත යුතු අතර සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පනතේ 27 වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් තීරණය කරනු | වෙළෙඳ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව අමාත්‍යාංශ මට්ටමින් 2023 වර්ෂය අග වනවිට මෙම වෙළෙන්දන් ලියාපදිංචි | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| ලබන රුපියල් ලක්ෂයක් නොඉක්මවන වාර්ෂික ගාස්තුවක් ගෙවිම මත සෑම වෙළෙන්දකුම අධිකාරයෙහි ලියාපදිංචි විය යුතු බවට දක්වා තිබුණ ද අධිකාරිය විසින් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංගය සහ දත්ත පද්ධතිය සකස් කිරීමේ පළමු අදියර අවසන් කිරීමට නියමිත වේ. | යුතුය. |
| (ඇ) අසාධාරණ වෙළඳ කටයුතු හේතුවෙන් බලපෑමට ලක් වූ පාරිභෝගිකයන්ට සහන සැලසීම සඳහා පාරිභෝගික අධිකාරි පනතේ 13 සහ 32 වගන්ති යටතේ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වී. නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ලබාදෙන ලද බලපත්‍රයට හෝ ඇප සහතිකයකට සම්බන්ධ කරුණු හෝ වෙනත් දෑ සමඟ අනුකූල වන ලෙස භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයිම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමර්ශනය කල හැකිය. කෙසේ වුවද. 2022 දෙසැම්බර් 31 දින වන විට 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලය තුළ දිස්ත්‍රික්කවලට ලද පැමිණිලි වලින් පැමිණිලි 284 ක් හා ප්‍රධාන කාර්යාලයට ලද පැමිණිලි වලින් පැමිණිලි 1078 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි. | සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට යම් පැමිණිලි ප්‍රමාණයකට අවසාන විසඳුම ලබා නොදුන්නද සෑම පැමිණිල්ලක්ම ලියාපදිංචි කිරීමත් සමග පැමිණිල්ල සම්බන්ධයෙන් පියවර ගැනීම ආරම්භ වේ. 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාමාර්ග ගනිමින් පැවති ලිපිගොණුවලින් ගොණු 1040 ක කටයුතු අවසන් කර ඇති අතර තවත් ගොණු 07 ක පමණක් කටයුතු අවසන් කිරීමට ඇත. 2022ට පෙර සියලුම වර්ෂවල පැමිණිලි සම්බන්ධයෙන් පාරිභෝගික පැමිණිලි ඒකකය ක්‍රියාමාර්ග ගෙන අවසන් කර ඇත.<br>2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලය තුළ දිස්ත්‍රික් කාර්යාල වෙත ලැබුණු පාරිභෝගික සහන පැමිණිලිවලින් ක්‍රියා මාර්ග ගැනීමට නියමිතව තිබූ පැමිණිලි 284 ක් සම්බන්ධයෙන් වන වර්ථමාන තත්ත්වය විගණනයට ඉදිරිපත් කර ඇත. | පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ( ඉ) සමාලෝචිත වර්ෂය තුල දිවයින පුරා වැටලීම් 23,280 ක් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබුණු අතර, එයින් | 2022 වර්ෂයේ මුල් මාස කිහිපය තුල රට තුල පවතී අර්බුදකාරී තත්වය හේතුවෙන් වර්ෂය තුල වැටලීම් 13,980 පමණක් සිදු කිරීමට හැකි විය. කොළඹ , නුවර, කළුතර, බදුල්ල හා නුවරඑළිය යන | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැටලීම් 13,980 ක් එනම් 60% ක් සිදුකර තිබුණි. කොළඹ, නුවර, කලුතර,ගාල්ල, බදුල්ල, නුවරඑළිය යන දිස්ත්‍රික්ක 06හි ඉලක්කගත වැටලීම් ප්‍රමාණයෙන් 50% කට අඩු වැටලීම් ප්‍රමාණයක් සිදුකර තිබුණි. | බදුල්ල දිස්ත්‍රික්ක වලට ඉලක්ක ලගා කර ගැනීමට ඉහත සඳහන් කරුණු වලට අමතරව නිලධාරී හිගය, වාහන ගැටළු ඇති වීම බලපා තිබුණි. | |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ ආනයනික හා දේශිය නිෂ්පාදිත භාණ්ඩවල ගුණාත්මකභාවය හා එම භාණ්ඩවලට අදාළ ප්‍රමිති නියාමනය කරන ආයතනවලට සම්බන්ධ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සඳහා ආයතන කිහිපයකින් ටෙන්ඩර් කැඳවූව ද, තාක්ෂණිකව සුදුසුකම් ලැබූ ආයතනවලින් ලබාදෙන ලද මිලගණන් අප ආයතනයට දැරීමට නොහැකි තත්ත්වයේ වූ බැවින්, එම දත්ත පද්ධතිය සකස් කිරීමට නොහැකි විය. | - එම- |
| (උ) | පරිගණක ආශ්‍රිත ක්‍රමවේදයක් තුළින් අත්‍යවශ්‍ය භාණ්ඩවල සිල්ලර මිල අධීක්ෂණය කිරිම සඳහා වර්ෂය තුළ භාණ්ඩ 40 ක් තෝරා ගෙන ඒවායේ පිරිවිතර සකස් කිරීමට සැලසුම් කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් නිලධාරින් දැනුවත් කිරිමේ වැඩසටහන් 4ක් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබුණද, වර්ෂය තුල එක් වැඩසටහනක් හෝ පවත්වා නොතිබුණි. | මෙම ක්‍රියාවලිය පරිගණක මෘදුකාංගයක් භාවිතයෙන් පරිගණක ආශ්‍රිත ක්‍රම වේදයක් භාවිතා කර සිදු කිරීමට සැලසුම් කළද එම පරිගනක මෘදුකාංගය හි වියදම ඇස්තමේන්තු ගත වියදමට වඩා අධික වූ බැවින් එම මිලදී ගැනීම සිදු නොවීම හේතුවෙන් එම ක්‍රියාවලිය සිදු නොවීය. නමුත් මෙම අත්‍යවශ්‍ය භාණ්ඩ වල සිල්ලර මිල රැස් කිරීමේ ක්‍රියාවලිය වර්ථමානයේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි විමර්ශන නිලධාරීන්ගේ සේවය ලබා ගනිමින් සිදු කරනු ලබයි. | - එම- |
| (ඌ) | පාරිභෝගික අධ්‍යාපනය හා දැනුවත්භාවය යන අරමුණු යටතේ පාසල් | 2022 වසර තුළ රටෙහි පැවැති ආර්ථික හා දේශපාලනික පසුබිම තුළ පාසල් වල ඉගැනිවීමේ කාල සටහන් සාමාන්‍ය | - එම- |

| | | |
|---|---|---|
| ආශ්‍රිත පාරිභෝගික කව 50 ක් පිහිටුවීමට සමාලෝචිත වර්ෂය තුල සැලසුම් කර තිබුණද, ඉන් පාරිභෝගික කව 7 ක් පමණක් පිහිටුවා තිබුණි. | ක්‍රියාවලියෙන් වෙනස් වූ අතර විෂය බාහිර ක්‍රියාවන් සඳහා ලබාදෙන ලද්දේ ඉතා සීමිත ඉඩකඩක් පමණි.<br>පාසල් පාරිභෝගික කව පිහිටුවීම පාසලෙහි එකඟතාවය මත පමණක් සිදුකරන කටයුත්තක් වන බැවින් එවැනි තත්ත්වයක් තුළ ඒ සඳහා හිමි වූයේ ඉතා සීමිත අවස්ථාවකි. | |
| (එ) ප්‍රති - තරඟකාරීත්වය සහ අසාධාරණ වෙළඳ පරිචයන්ගෙන් නිෂ්පාදනයන් සහ වෙළඳුන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් රාජ්‍ය හා පෞද්ගලික කතිකාවත් (Public and Private Dialogue) පැවැත්වීමට සැලසුම් කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි. | අන්තර්ජාලය හරහා වෙළෙඳාම් කරන වෙළෙඳුන් විසින් සිදුකරන අසාධාරණ වෙළෙඳ පිළිවෙත් අවම කිරීම සඳහා අධිකාරිය විසින් 2020වර්ෂයේ දී මෙකී ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් සකස් කොට 2021ජුනි 30, 2022මැයි 15සහ 2022 ඔක්තෝබර් 19 යන දිනවල රාජ්‍ය හා පෞද්ගලික කතිකාවක් පවත්වන ලදි . එකී කතිකාවල ප්‍රතිඵලයක් ලෙස වර්තමානය වනවිට අන්තර්ජාලය හරහා වෙළෙඳාම් කරන වෙළෙඳුන් නියාමනය කිරීම සඳහා අධිකාරිය විසින් නියෝගයක් නිකුත් කර ඇත. | වෙළඳුන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් සිදු කරන කතිකාවක් සැලසුම් කල අයුරින් සිදු කළ යුතු වීම. |
| (ඒ) එක් එක් දිස්ත්‍රික්ක ප්‍රධානින් වෙත නිකුත් කර ඇති උපයාදුත මුදලින් රු. 160,526 ක මුදලක් වර්ෂ 05 කට අධික කාලයක සිට පියවා නොතිබූ අතර, එම මුදල අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම උපාය දූත මුදල් පියවා ගැනීම් දැනටමත් සිදුවෙමින් පවතින අතර මෙම වර්ෂය අවසාන වන විට එම මුදල් සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. | නොපියවූ උපයාදුත මුදල් කඩිනමින් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඔ) අනාරක්ෂිත හා තත්ත්වයෙන් බාල නිෂ්පාදන වලින් පාරිභෝගිකයන් සුරක්ෂිත කරලීම අරමුණු කර ගනිමින් අධිකාරිය විසින් හඳුනාගත් නිෂ්පාදන කීපයක් සඳහා ආරක්ෂිත ක්‍රමවේදයක් සකස් කිරීමට තීරණය කර තිබුණු අතර ඒ සඳහා ස්විට්සර්ලන්තයේ Sicpa Security Solution SA සමාගම සමඟ 2014 | විධාන අංක 49 නිෂ්ප්‍රභා කරවා ගැනීමටත් සහ තවත් ඉල්ලීම් කිහිපයක් මුල් කරගනිමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට විරුද්ධව ගරු අභියාචනාධිකරණය ඉදිරියේ නිෂ්පාදනය සංගම් විසින් අංක 281/14 writ දරන නඩුව පවරන ලදී. එකී ඉල්ලීම් සළකා බලමින් අභියාචනාධිකරණය විසින් නඩු විභාගය අවසන් කරමින් අවසාන තීන්දුව ලබාදෙන තෙක් විධාන අංක 49 හි ක්‍රියාත්මකභාවය වළක්වමින් අතුරු නියෝගයක් නිකුත් කල අතර ඒ අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට SICPA SECURITY SOLUTION SA සමාගම සමග එළඹි | ක්‍රියාත්මක කිරීමේ හැකියාව තහවුරු කර ගැනීමෙන් පසුව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

ජනවාරි මස 24 දින ගිවිසුමකට එළඹ තිබුණි. මේ පිළිබඳව අධිකාරිය විසින් 2014 පෙබරවාරි මස 24 දින අංක 1851/1 දරණ ගැසට් පත්‍රය මගින් අංක 49 වෙනි විධානය නිකුත්කර තිබුණි. කෙසේ වුවද. ඉහත කී විධාන අංක 49 නිශ්ප්‍රභා කරවා ගැනීම සඳහා භාණ්ඩ නිෂ්පාදන සමාගම් කීපයක් විසින් අධිකාරියට විරුද්ධව මහා අධිකරණයේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කර තිබුණු අතර ඒ අනුව විධාන අංක 49 හි ක්‍රියාකාරිත්වය මහාධිකරණය මගින් වලක්වමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම හේතුවෙන් Sicpa Security Solution SA සමාගම සමඟ එළඹි ගිවිසුමට අනුකූලව ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට කරගෙන යාමට අධිකාරියට නොහැකිවී තිබුණි.

ගිවිසුම ක්‍රියාත්මක නොවීම හේතුවෙන් Sicpa Security Solution SA සමාගම විසින් ඒකපාර්ශවීයව ගිවිසුම අවලංගු කර ගිවිසුමේ 3.3.2 වගන්තිය අනුව සම්පූර්ණ ආයෝජන මුදල වන රු.බිලියන 2.716 ක මුදලක් හානි වෙනුවෙන් ගෙවන ලෙස ඉල්ලා 2018 ජූලි 30 වන දින ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ (International Chamber of Commerce) බේරුම් කරණ නඩුවක් ගොනු කර තිබුණි. එහි අවසාන ගිවිසුමට අනුකූලව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු කරගෙන යාමට නොහැකි විය. ගිවිසුමට අනුකූලව ව්‍යපෘති කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් 281/14 writ දරන නඩුවට අදාල අතුරු නියෝගය පරිදි ගිවිසුමේ පූර්වගාමී කොන්දේසීන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරලීමට නොහැකිවීම වීම මත SICPA SECURITY SOLUTION SA සමාගම විසින් ඒක පාර්ශවීයව ගිවිසුම අවසන් කරනු ලැබීය. SICPA SECURITY SOLUTION SA සමාගම විසින් ගිවිසුමේ කොන්දේසීන්ට අනුව මෙම ගැටළුව සම්බන්ධව ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ බේරුම්කරණ නඩු කටයුත්තක් 2018.07.30 දින ගොනුකරන ලදී.

2022.05.10 දින නිකුත් කර තිබූ බේරුම්කරණ නඩුවේ අවසාන ප්‍රදානයට එරෙහිව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2022.07.07 වන දින කොළඹ වාණිජ මහාධිකරණයේ අංක CHC/626/22/ARB යටතේ පෙත්සමක් ගොනු කර ඇත. එම නඩුව වගඋත්තරකාර SICPA SECURITY SOLUTION SA ආයතනය නොතීසි සඳහා 2023.07.24 ගරු අධිකරණයේ කැඳවීමට නියමිත වන අතර එකී නඩුව වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව ද පෙනී සිටින බව දන්වා සිටිමි.

ප්‍රදානය 2022 මැයි 10 දින නිකුත් කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් Sicpa Security Solution SA සමාගම වෙත රු.බිලියන 2.716 ක් ද ඇ.ඩො. 325,000 මුදලක් බේරුම්කාර ගාස්තුව වශයෙන්ද ගෙවියයුතු විය. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විදේශීය සමාගමක් සමග ගිවිසුම් ගත වීමට පෙර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව සම්බන්ධයෙන් අදාල භාණ්ඩ නිෂ්පාදන සමාගම් පදනම් කරගත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ බවට විගණනයේදී තහවුරු නොවීය. බේරුම්කරණ නඩුවේ අවසාන ප්‍රදානයට එරෙහිව අධිකාරිය විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ2022 ජූලි 07 දින CHC/626/22/ARB අංක දරන පෙත්සමක් ගොනු කර තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පාරිභෝගික ගැටළු ක්ෂණිකව ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට වෙළඳපොල මිල ගණන් දැන ගැනීම සඳහා 2015 වර්ෂයේදී 1977 දරන පාරිභෝගික විමසුම් සේවා ( 1977 Interactive Mobile Service ) මෘදුකාංගය වෙනුවෙන් අධිකාරිය විසින් රු.5,401,428 ක් සහ මෙම ව්‍යාපෘතිය ජනතාව වෙත ප්‍රචාරණය කිරීම සඳහා රු.3,786,942 ක් වැය කර තිබුණි. | අදාළ ආයතනය සමග අධිකාරිය ගිවිසුම් ගත වූයේ 2014.01.20 දින සිට මූලික වශයෙන් අවුරුදු පහක් සඳහා වන අතර ඉන් පසුව ගිවිසුම දීර්ඝ කිරීමක් සිදු නොවිනි. නමුදු 1977 කෙටි දුරකථන අංකය පාරිභෝගික පැමිණිලි ලබා ගැනීම සඳහා වර්තමානයේ දී ද සාර්ථකව භාවිතා කරනු ලබයි. පැමිණිලිකරු වෙත විමර්ශනයේ ප්‍රගතිය දැනුම් දීම සඳහා නියමු ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක කිරීමට වර්තමානයේ කටයුතු කරමින් පවතී.<br>ඊට අතිරේක අපේක්ෂා කරන ලද කාර්යයන් ඉටුකරගත නොහැකි වූ ව්‍යාපෘතියක් බව | ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද කාර්යයන් ඉටු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | |
|---|---|
| කෙසේ වුවද, තාක්ෂණික ගැටලු පැනනැගීම සහ භාණ්ඩ මිලගණන් යාවත් කාලීන නොකිරීම, සියලු දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධ කිරීමෙන් දත්ත ඇතුලත් කිරීමට හැකි වන පරිදි ක්‍රමවේදයක් ඇති නොකිරීම, පැමිණිලිකරු වෙත කෙටි පණිවිඩයක් මගින් මාර්ගගත පැමිණිල්ලේ අංකය හා විමර්ශනයේ ප්‍රගතිය දැනුම්දීමට ක්‍රමවේදයක් සකස් නොකිරීම වැනි දුර්වලතා හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද කාර්යයන් ඉටු වී නොතිබුණි. | පිළිගනිමි. මේ සඳහා අදාළ වශයෙන් වත්මන් ආර්ථික, සමාජ අවශ්‍යතාවයක් හඳුනා ගනිමින් හා පාරිභෝගික අධිකාරි පනතේ අරමුණු වඩාත් ඉහල මට්ටමින් ඉදිරි අවශ්‍යතාවයද හඳුනාගනිමින් පාරිභෝගික තෘප්තිය ඉහළ මට්ටමින් ලබාදීම සඳහා සියලුම ආංශික ඒකාබද්ධතාවයන් සහිතව නව මෘදුකාංගයක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු මේ වන විට සැලසුම් කරමින් සිටි. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

[[[

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් රු. 200,000 ක් පිරිවැය වූ තොග කළමනාකරණ මෘදුකාංගයක්, රු.250,000 ක් පිරිවැය වූ දඩ මුදල් සහ උපායදූත මුදල් කළමනාකරණ මෘදුකාංගයක් සහ රු.54,000 ක් පිරිවැය වූ වත්කම් කළමනාකරණ මෘදුකාංගයක් 2015 සහ 2017 වර්ෂවලදී මිලදී ගෙන තිබුණු අතර එම මෘදුකාංග මෙම වාර්තාවේ දිනය දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. | උපාය දූත මුදල් හා අනෙකුත් පද්ධතීන් සම්බන්ධව සේවක පුහුණු වීම්ද, අමතර වැඩ කටයුතුද කර තිබූ අතර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ස්ථාපිත කිරීමට මේවනවිට කටයුතු කිරීමට යෝජනා වී ඇත. දැනට අර්ධවශයෙන් ක්‍රියාත්මක වන මෘදුකාංගද එම පද්ධතියට අන්තර්ග්‍රහණය කිරීමේ හැකියාව පිළිබඳ තොරතුරු තාක්ෂණ විශේෂඥයින්ගෙන් විමසන ලදුව, ඔවුන් විසින් එම මෘදුකාංග ඒකාබද්ධ හැකි බව තහවුරු කර ඇත. ඒ අනුව මෙම මෘදුකාංග කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ඒකාබද්ධ කර භාවිතයට නියමිතය. එතෙක් මෙම මෘදුකාංග වලින් තොග කළමනාකරණ සහ වත්කම් කළමනාකරණ මෘදුකාංගයන් වලින් මූලික දත්ත යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. | නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම් අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව යොදා ගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අධ්‍යක්ෂ තනතුරු 2ක් ,සහකාර අධ්‍යක්ෂ | රේඛීය අමාත්‍යාංශයේ ලේකම් මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා අනුමැතිය ලබාගැනීමට ඉල්ලුම් කර ඇත. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර පනතේ ප්‍රධාන අරමුණු කර්යක්ෂමව ඉටු කර ගැනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| තනතුරු 6 ක් ,නිතිය හා සවිබල ගැන්වීමේ නිලධාරී තනතුරු 5ක් සහ විමර්ශන නිලධාරි තනතුරු 100 ක් පුරප්පාඩු වීම හේතුවෙන් පනතේ ප්‍රධාන අරමුණු කර්යක්ෂමව ඉටු කර ගැනීම කෙරෙහි නිලධාරී පුරප්පාඩු අහිතකර ලෙස බලපා තිබුණි. | .සහකාර අධ්‍යක්ෂ (ප්‍රාදේශීය කටයුතු) තනතුරු 6ක් සඳහා 2023.05.02 දින සිට එම තනතුරුවල රාජකාරී ආවරණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරීන් 6 දෙනෙකු යොදවා ඇත.<br>තවද, පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ (නීති හා බලගැන්වීම්) තනතුර සඳහා ස්ථිර සේවකයෙකු බඳවා ගැනීම සඳහා 2023.05.25 දින පුවත්පත් දැන්වීම් පළකර බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, රේඛීය අමාත්‍යාංශයේ හා ලංකා සතොස ආයතනයේ නීති උපදේශක එම තනතුරේ රාජකාරීන් සඳහා හදිසි සේවා ඉටු කිරීමේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 යටතේ යොදවා ඇත. නීති හා බලගැන්වීම් නිලධාරී තනතුරු 05 සඳහා මේ වනවිට නීතිඥයින් 05 දෙනෙකු පත්කර එම පුරප්පාඩු ස්ථිරව පිරවීමට කටයුතු සිදුකර ඇත. | යුතුය. |